# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 159/3 — 1975 අප්‍රේල් 16 වැනි බදාදා — 1975.04.16**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය

1975 අංක 187/1

කෘ. ඉ./අංකය : ජේ. 258(බීආර්)  ජනා. කා. අංකය : එල්. 91(2)

1964 රේ අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත, (460 වැනි අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 19 වැනි වගන්තියේ (1) හා (2) වැනි උප වගන්තිවල විධිවිධාන යටතේ කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමාගේ උපදෙස් පිට, ජනාධිපතිතුමන් විසින් එල්. බී. ද සිල්වා මහතා 1975 අප්‍රේල් 1 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා, එහි සඳහන් වන පරිදි අභියාචනා විසඳීම පිණිස වූ සමාලෝචන මණ්ඩලයේ නීතිඥ සාමාජිකයකු වශයෙන් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද, එකී පනතේ 19(3) වැනි වගන්තියේ විධිවිධාන යටතේ උතුමාණන් වහන්සේ විසින්, එල්. බී. ද සිල්වා මහතා, 1975 අප්‍රේල් 1 වැනි දින සිට, එම මණ්ඩලයේ සභාපති වශයෙන් ද පත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

බී. එස්. ජේ. ද මැල්,
ජනාධිපතිතුමාගේ ලේකම් වෙනුවට.

ජනාධිපතිතුමාගේ කාර්යාලය,
කොළඹ, 1975 අප්‍රේල් 15 වැනි දින දීය.

4-498

---

## මිල පාලන දැන්වීම්

### මිල පාලන පනත

### ආඥාවන් අවලංගු කිරීමේ නියෝගය

(173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විල්ප්‍රඩ් ජයසූරිය වන මම, 1974 නොවැම්බර් මස 12 වැනි දින අංක 137/7 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කර තිබූ 1974 අංක 3 දරණ (ආනයනය කරන ලද රෙදිපිළි) මිල පාලන ආඥාව වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරමි.

විල්ප්‍රඩ් ජයසූරිය,
මිල පාලක,
(ආහාර හා විවිධ ද්‍රව්‍ය).

1975 අප්‍රියෙල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

4-473/1

---

### වෙළෙඳුන්හට බලපත්‍ර නිකුත් කිරීමේ පනත

(ආහාර හා විවිධ ද්‍රව්‍ය) මිල පාලක හා මුළු දිවයින සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වූ විල්ප්‍රඩ් ජයසූරිය වන මම, 1974 නොවැම්බර් මස 12 වැනි දින අංක 137/7 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කර තිබූ ප්‍රාදේශික සමුපකාර-කඩ සමිතිවල රෙදිපිළි විකිණීම පිළිබඳ කොන්දේසි වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරමි.

විල්ප්‍රඩ් ජයසූරිය,
මිල පාලක,
(ආහාර හා විවිධ ද්‍රව්‍ය).

1975 අප්‍රියෙල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

4-473/2


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

264/5——ඊ. 13760—6,550 (75/04)